## 14

# අමරණීය නර්තනවේදියා

විසිවන සියවසේ මෙරට කලා ශිල්පීහු රැසක් බිහිවූහ. ඒ අතරෙන් පණීභාරත මහතාට හිමි වන්නේ විශේෂ ස්ථානයකි. එතුමා ජාතියේ පිනට පහළ වූ කලාකරුවෙකි. දේශීය නර්තන කලාව නව මාවතකට පිවිසියේ ඔහු නිසා ය.



වර්ෂ 1920 සැප්තැම්බර් 24 වැනි ද අල්ගම දී ඔහු මෙලොව එළිය දුටුවේ ය. අල්ගම පබානිස් ගුරුතුමා සහ උඩුරැවෙල නයියණ්ඩිකාර ගණිතයලගේ ඩිංගිරිඋක්කු ඔහුගේ දෙමවුපියෝ වූහ. පානිස්ට හැමදෙනා ම ඇමතුවේ “පණී” යන සුරතල් නාමයෙනි. වයස අවුරුදු හතරේ දී

පමණ ඔහු පන්සලෙන් අධ්‍යාපනය ඇරඹී ය. පසු ව ගමේ පාසලට ඇතුළත් විය. ඔහු ඉගෙනීමට ද ක්‍රීඩාවට ද එක සේ ඇලුම් කළේ ය.

එකල ගමේ ළමයින් ඉගෙනුම ලැබුයේ යමක් කියවා ගැනීමටත් ලිවීමටත් අවශ්‍ය දැනුම සඳහා පමණි. ඊට වඩා පාරම්පරික කලාශිල්ප ඉගෙනීම සාමාන්‍ය සිරිත විය. පානිස් ශිෂ්‍යයා ඉගෙනීම ලැබුයේ සතර වන පන්තිය සමත් වන තෙක් පමණි. එහෙත් ඔහුට උගත් දේ මතක තබා ගැනීමේ සහජ වාසනා ගුණය පිහිටා තිබුණි. තමා උපන් ගැමි පරිසරයට ඔහු වඩාත් ඇලුම් කළේ ය. හේන් කුඹුරු, ගහ කොළ, සතා සීපාවාගෙන් යුත් රමණීය වටාපිටාව ඔහුට අත්දැකීම් ලබා දුන්නේ ය.

පානිස්ගේ පවුලේ වැඩිහිටියන් රාත්‍රි නින්දට පෙර කවි ගී කියමින් විනෝද වීම සිරිතකි. ඔවුන්ගේ දරුවෝ ද මෙම ගායනාවලට එක් වූහ. ඔවුහු නිදිමත වන තෙක් කවි ගී කටපාඩම් කළහ. පානිස් ශිෂ්‍යයා ගායනයට හා වාදනයට එක සේ දස්කම් පෑවේ ය. හිමිදිරියේ ම නැඟිට තම්මැට්ටම් වාදනය කිරීම ඔහුගේ සිරිත විය. ඔහු නැටුම් ගැයුම් හා වැයුම් උගත්තේ අල්ගම මහගෙදර කලායතනයෙනි.

වයස අවුරුදු අටේ දී ඔහු ශ්‍රී ලංකා ගුවන්විදුලි සේවයේ පළමුවැනි මඟුල්බෙර වාදනය ඉදිරිපත් කිරීමට ද වාසනාව ලැබී ය. කුඩා අවධියේ සිට ම මහනුවර ඇසළ පෙරහැරේ රැඟුම් දැක්වීමට ද ඔහුට අවස්ථාව උදා විය. ඔහු නැටුම් ගැයුම්වලට අමතර ව බලිතොවිල්, නක්ෂත්‍ර ආදිය ද හදාළේ ය. පානිස් ශිෂ්‍යයා බෙරවාදන, කස්තිරම් ආදිය උගත්තේ සිරියා ඇදුරුතුමාගෙනි. කුඩා කල සිට ම නැටුම් කලාවට ඔහු තුළ වූයේ දැඩි උනන්දුවක් හා කැප වීමකි. උඩරට, පහතරට, සබරගමු සම්ප්‍රදායන්ට අයත් ශිල්පීන්ගෙන් ඔහු නැටුම් කලාව දියුණු කර ගත්තේ ය.

උඩරට නැටුම් ශිල්පියකුගේ ජීවිතයේ වැදගත් අවස්ථාව කළඑළි

මංගල්‍යයයි. එනම්, වෙස් ඇඳුම් කට්ටලයෙන් සැරසී පළමුවරට නර්තනයේ යෙදීමයි. පාරම්පරික සිරිත් අනුව එම උත්සව විහාර භූමිවල දී සිදු කෙරේ. පානිස් තරුණ ශිල්පියා වෙස් පැළඳියේ විසිවැනි වියෙහි දී ය.

සැම පෙරහැර, පිංකම්, දෙවොල්මඩු ආදි සංදර්ශනවල දී ඔහු බුහුමන් ලැබී ය. ශිෂ්‍යත්වයක් මත ඉන්දියාවේ ශාන්ති නිකේතනයේ දී ශිල්ප හැදෑරීමට ඔහුට අවස්ථාව උදා විය. ඔහු එහි දී භරත, කථකලි ආදි නැටුම් සම්ප්‍රදායයන් ද, තබ්ලා, ශුද්ධ මද්දල ආදි වාද්‍ය භාණ්ඩ වැයීමට ද උගත්තේ ය. සංගීතය, චිත්‍ර හා මූර්ති කලාව ද ඔහු මැනවින් හැදෑරී ය. ශාන්ති නිකේතනයේ දී පානිස් ශිල්පියා කැපී පෙනෙන ශිල්පියකු ලෙස සම්මාන ලැබී ය. මේ නිසා මෙරටට පැමිණි පසු "පණිභාරත" නම ලැබිණ.

නර්තන කලාවේ නව මං පෙත් විවර කිරීම ඔහුගේ එක ම අරමුණ විය. සත්පත්තිනි, මහවැලි, අපේ ගමට මල් පිපිලා, රණබිම, බතේ උපත ආදි නිර්මාණ ඔහු මෙරටට දයාද කළේ ය.

පණිභාරත මහතා පළමු ව කොළඹ රාජකීය විද්‍යාලයේ ඇදුරුතුමකු ලෙස පත් විය. පසු ව මීරිගම අභ්‍යාස විද්‍යාලයේ හා රජයේ ලලිත කලායතනයේ කථිකාචාර්ය ධුරයන්හි වැඩ බැලී ය.

මෙම සේවාවන් වෙනුවෙන් ඔහුට කැලණිය විශ්ව විද්‍යාලය මඟින් දර්ශනසූරි සම්මානය පිරිනැමී ය. සබරගමුව විශ්වවිද්‍යාලය මඟින් සාහිත්‍යසූරී සම්මානය පිදූ අතර එහි රංග පීඨය ද මෙතුමා නමින් හැඳින්විණි.

එතුමා දයාව, කරුණාව, ආදි මානව හිතවාදි ගුණාංගවලින් හෙබි යේ ය. වර්ෂ 2005 සැප්තැම්බර් මාසයේ දී එතුමා ජීවිතයෙන් සමුගත්තේ ය.

# ක්‍රියාකාරකම්

01). මෙම පාඩම ශබ්ද නගා කියවන්න.

02). පාඩම කියවා පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i පණිභාරත මහතාගේ උපත සිදුවූයේ කවදා ද?

ii ඔහුගේ දෙමව්පියෝ කවරහු ද ?

iii පණිභාරත මහතාට කලා ලොවේ විශේෂ ස්ථානයක් හිමිවන්නේ ඇයි ?

iv ළමා වියේ දී ඔහු අධ්‍යාපනය ලැබූ අයුරු ලියන්න.

v පානිස් ශිෂ්‍යයා තුළ පැවති විශේෂ දක්ෂතා මොනවා ද?

vi ශාන්ති නිකේතනයේ දී ඔහු උගත් ශිල්ප කලා මොනවා ද?

vii පණිභාරත මහතාට එම නම ලැබුණේ ඇයි?

viii පණිභාරත මහතාගේ නිර්මාණ නම් කරන්න.

ix ඔහු ලැබූ සම්මාන කවරේ ද?

x පණිභාරත මහතා ශ්‍රේෂ්ඨ කලාකරුවෙකු ලෙස ප්‍රසිද්ධ වූයේ ඇයි?

03) මෙම වාක්‍යවල හිස්තැනට සුදුසු පද පහත තිබෙන රවුමින් ගෙන යොදන්න.

i පණ්ඩිභාරත මහතා මූලික________________ ලැබුවේ පන්සලෙනි.

ii ලංකාවේ ________________ කෙරෙහි භාරතීය බලපෑම දැකිය හැකි ය.

iii ________________ පිරිසිදු වී තිබීම නිරෝගිකමට හේතු වේ.

iv ඔහු උත්සව ________________ පැහැර හැරියේ නැත.

v රටට සේවයක් කළ කලාශිල්පීන්ට අප ________________ දැක්විය යුතු ය.




04) (අ) පහත දැක්වෙන යෙදුම්වල අදහස කියන්න.

i ජාතියේ පිනට පහළ වූ
ii සහජ වාසනා ගුණය
iii නව මං පෙත් විවර කිරීම
iv ජීවිතයෙන් සමුගත්තේ ය
v දයාද කළේ ය

(ආ) පහත දැක්වෙන වාක්‍යවල හිස්තැනට ගැළපෙන යෙදුම් පහත තිබෙන රවුමින් තෝරා ගෙන ලියන්න.

i ඔහුගේ නම ......................ලියැවී ඇත.
ii ජීවිතය ................ ................. නොවන බව සිතන්න.
iii හිරු බටහිර මුහුදෙහි ........................
iv ඔහු .............. ............... ........... අල්ගම නිවසේ දී ය.
v හිරු රැස් වැදී නෙළුම් මල් ......................
vi සරෝජා .................. ............... වැඩ කරන ළමයෙක් නොවේ.
vii ගල්පරයක වැදීමෙන් අබලන් වූ නැව .................... විය.
viii උත්සාහය නිසා ඔහු ................ ................ ඉහළ නැංගේ ය.
ix මගේ මිතුරා ..................
x දෙමව්පියන්ගේ වියෝවීම නිසා ඔහුට ජීවිතය ............... .........

රෝස මල් යහනාවක්,
සිනාසෙයි, තිත්ත විය,
අඩියෙන් අඩිය, ආවාට ගියාට,
රන් අකුරෙන්, මුහුදු බත්,
පොත් කාවෙකි, ගිලී ගියේ ය,
මෙලොව එළිය දුටුවේ,

## භාෂා භාවිතය

01) ඉරි ඇඳි පද ගැන සැලකිලිමත් වෙමින් පහත සඳහන් වාක්‍ය කියවන්න.

i ඔබත් මමත් පුස්තකාලයට ගියෙමු.
ii ඔහුත් ඔබත් විනෝද ගමනක් ගියෙහු.
iii අම්මා ද නංගී ද රෝහලට ගියහ.
iv නංගී ද මල්ලී ද පාසලට ගියෝ ය.
v බළලා නොහොත් බල්ලා ඒ මල් බඳුන බින්දේ ය.
vi නෙරළුතුර හෙවත් පොල්ගස මුහුදුබඩ ප්‍රදේශයේ සරුවට වැඩේ.
vii ලිපිකරුවන් ලිපිගොනු පරීක්ෂා කරන අතර අධ්‍යක්ෂතුමා දුරකථනයට සවන් දුන්නේ ය.

ඉහත දැක්වෙන වාක්‍යවල ඉරි ඇඳි පද විමසා බලන්න. ඒවා වාක්‍ය සම්බන්ධ කිරීම සඳහා යෙදෙන නිපාත වේ. මෙබඳු වාක්‍යවල ක්‍රියා පදය ගැළපිය යුත්තේ ආසන්න නාමපදයට අනුව ය.

02). පහත සඳහන් වාක්‍යවල හිස්තැන්වලට ගැළපෙන පද සොයන්න.

i ඔබත් ............ රෝගියකු බැලීමට රෝහලට යමු.

ii මල්ලීත් ඔබත් ඒ වැඩය ............. ?

iii අම්මා ද නංගී ද චාරිකාවට සහභාගි ................

iv සේන ද තාත්තා ද උයනෙහි පැළ ...................

v දනපතියා ................ධනවතා අසරණයාට පිහිට වෙයි.

vi පෙරදිග මුතුඇටය ............. ශ්‍රී ලංකාව, අපේ මවුබිම වෙයි.

vii ගොවියන් කෙතෙහි ගොයම් කැපූ..........ගෙවිලියෝ ඒවා කමතට ගෙන ගියහ.

viii ගුරුතුමිය පාඩම පැහැදිලි කරන අතර අපගෙන් ප්‍රශ්න ද .......................

ix පුලතිසිපුරය ................. පොළොන්නරුව පැරණි රාජධානියකි.

x නව පාර්ලිමේන්තුව පිහිටා තිබෙන්නේ ශ්‍රී ජයවර්ධන පුරයේ ................ කෝට්ටේ ය.

**පැවරුම්**

01). පණීභාරත මහතා ඔබ යයි සිතා එතුමා පිළිබඳ ව කතාවක් කරන්න.

02). පන්තියේ සිසුන් කණ්ඩායම්ගත වී සමාජයට සේවාවක් කළ විශේෂ පුද්ගලයන්ගේ නාම ලේඛන සකස් කරන්න.

03).i පහත සඳහන් පුද්ගලයන් අතුරෙන් ඔබ වඩාත් කැමැති චරිතයක් ගැන කතාවක් කරන්න.

- වීරවරයෙක්/වීරවරියක්
- රජ කෙනෙක්
- කලා ශිල්පියෙක්
- විද්‍යාඥයෙක්
- ලේඛකයෙක්/ලේඛිකාවක්

ii ඉහත චරිත අතරින් ඔබේ සිත් ගත් එක් චරිතයක් ඔබ යයි සිතා ඔබ කළ කතාව ලියන්න. එය පන්තියට ඉදිරිපත් කරන්න.

04). අතිරේක කියවීම්

## ආනන්ද කුමාරස්වාමි

පෙරදිග භාෂා, දර්ශනය හා සංස්කෘතියේ අගය ලොවට කියා පෑ වියත්හු කිහිපදෙනෙක් වෙති. ස්වාමි රාම ක්‍රිෂ්ණ, ස්වාමි විවේකානන්ද, රවීන්ද්‍රනාත් තාගෝර්, ඇනීබෙසන්ට් එවැන්නෝ ය. ඔවුන් අතරට ආනන්ද කුමාරස්වාමි නම ද ඇතුළත් වීම අතිශයෝක්තියක් නොවේ.

ආනන්ද කෙන්ටිශ් කුමාරස්වාමි කලාකරුවකු පමණක් නොව ශාස්ත්‍රඥයෙක් ද විද්‍යාඥයෙක් ද විය. ඔහු උපන්නේ වර්ෂ 1877 අගෝස්තු 22 ද ය. ඔහුගේ පියා වූ සර් මුත්තු කුමාරස්වාමි නයිට් පදවියෙන් පිදුම් ලැබූ ප්‍රථම ආසියාතිකයා වෙයි. මව එංගලන්තයේ එලිසබෙත් ක්ලේ බිබී නම් ඉංග්‍රිසි කාන්තාවකි.

ආනන්ද, ඉපදී නොබෝ දිනකින් මව ඔහු රැගෙන එංගලන්තයට ගියා ය. ඔහු අධ්‍යාපනය ලැබුයේ වයිට්ක්ලිෆ් විද්‍යාලයෙනි. ඔහු පාසලේ දීප්තිමත් ශිෂ්‍ය නායකයෙක් විය. භූ ගර්භ විද්‍යාවට දස්කම් පෑ ඔහු විද්‍යාලයීය සඟරාවලට ඒ සම්බන්ධ ව නිතර ලිපි ලිවී ය. එසේ ම පාපන්දු ක්‍රීඩාවේ ප්‍රධානියා ද විය. එවක පැවති පරීක්ෂණ වූ ලන්ඩන් "මැට්‍රික්‍යුලේෂන්" සහ "ඉන්ටර් ආට්ස්" විභාගවලින් ඔහු උසස් ලෙස සමත් විය. පසුව භූ ගර්භ විද්‍යාව පිළිබඳ ගෞරව උපාධි ලැබී ය. 1903 දී ලන්ඩන් විශ්ව විද්‍යාලයේ පර්යේෂකයෙකු වශයෙන් සේවයට පත් විය.

ආනන්ද කුමාරස්වාමි මහතා ලංකාවට පැමිණියේ වයස අවුරුදු විසිහයේ දී ය. ඒ ඛනිජ විද්‍යා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ තනතුරට පත් වෙමිනි. මෙරට ඛනිජ වර්ග පිළිබඳ තොරතුරු සොයමින් ඔහු ලංකාවේ සෑම පළාතක ම සංචාරය කළේ ය. භූ ගර්භ විද්‍යා ගවේෂණයට වඩා, මෙරට සිතුවම් කලාව, පුරාවිද්‍යාව, ආගම, සමාජ විද්‍යාව කෙරෙහි ඔහු වඩාත් ඇලුම් කළේ ය. ගැමියන් සමඟ පැවැත් වූ සුහද කතාබහ හේතුවෙන් මෙරට ජන සාහිත්‍යය හා කලා ශිල්ප කෙරෙහි ඔහු තුළ පැවති රුචිය තවදුරටත් වර්ධනය විය. ඒ අනුව ඔහු උඩරට කලා ශිල්ප පිළිබඳ ව සාරවත් ලිපි සඟරාවල පළ කළේ ය.

1906 අවසාන භාගයේ දී ඉන්දියාවට ගිය කුමාරස්වාමි මහතා ඉන්දියානු දර්ශනය, සාහිත්‍යය හා කලාව මැනවින් හැදෑරී ය. ඒ මඟින් ඉන්දියානු චිත්‍ර කලාව හා කැටයම් කලාව පිළිබඳ ලිපි රැසක් පළ කළේ ය.

මේ කාලයේ දී ම ලංකාවේ කලා ශිල්ප හා ශිල්පීන් පිළිබඳ ව **"මධ්‍ය කාලීන සිංහල කලා"** නම් කෘතිය එළි දැක්වී ය. මේ ග්‍රන්ථය වෙනුවෙන් ඔහුට ලන්ඩන් විශ්ව විද්‍යාලයෙන් විද්‍යාව පිළිබඳ ආචාර්ය උපාධිය ලැබිණ.

1910 දී ඔහු **'ඉන්දියානු කලාවේ තෝරාගත් නිදර්ශන'** මැයෙන් උසස් ගණයේ චිත්‍ර 40 ඇතුළත් විවරණ ග්‍රන්ථයක් නිකුත් කළේ ය. විශ්ව කර්ම නමින් ඉන්දියානු චිත්‍ර 100 ඇතුළත් කෘතියක් ද ප්‍රකාශයට පත් කළේ ය. 1927 දී **බුදු පිළිමයේ උපත,** 1934 දී **බෞද්ධ ප්‍රතිමා විද්‍යාවේ ප්‍රාරම්භක කරුණු,** 1938 දී **ඉන්දියාව මධ්‍යම ආසියාව හා ලංකාවේ සිතුවම්** නමැති කෘතිය ද සම්පාදනය කළේ ය. ඔහු කළ විශාලතම ග්‍රන්ථය බොස්ටන් ලලිත කලා කෞතුකාගාරයේ **ඉන්දියාවේ නිදර්ශන නාමාවලිය** යි. එය කාණ්ඩ පහකින්

යුක්ත විය. මෙම ග්‍රන්ථ මඟින් කුමාරස්වාමි මහතා තුළ පැවති පාලි භාෂා දැනුම හා බෞද්ධ දර්ශනය පිළිබඳ විස්මයජනක අවබෝධය කෙබඳු වී ද යන්න පැහැදිලි වේ.

ආනන්ද කුමාරස්වාමි මහතා ප්‍රසිද්ධියට කැමති නොවූ පුද්ගලයෙක් විය. ඔහු කිසිවිට මෙරටින් සොයා ගත් ඛනිජ වර්ග තමාගේ නමින් හඳුන්වා නො දුන්නේ ය. ඔහුගේ උපදෙස් පතා පැමිණි සියලු දෙනාට ම අවංක ව කාරුණික ව තමා දන්නා දේ ඉගැන්වීය. ශාස්ත්‍රීය කටයුතු මෙන් ම මල්, පලතුරු වැවීම ගැන ද ඔහු උනන්දුවක් දැක්වූවෙකි. ඔහුගේ ගෙවත්ත අවුරුද්ද පුරා ම මලින් පිරී තිබිණ. ඔහු සුන්දරත්වය අගය කළ බවට මෙය කදිම නිදසුනකි.

ආනන්ද කුමාරස්වාමි මහතා ජීවිතයේ සැඳෑ සමය ගත කළේ ඇමෙරිකාවේ බොස්ටන් නුවරින් ඈත පිහිටි ගම්බද නිවෙසක ය. ලොවට මාහැඟි ග්‍රන්ථ රාශියක් පිරිනැමූ ඔහු වර්ෂ 1947 සැප්තැම්බර් 09 දින මෙලොවින් සමුගත්තේ ය.

## තෙලි තුඩින් පෑ දස්කම්

දකුණු ලක පිහිටි අම්බලන්ගොඩ ප්‍රදේශය සාම්ප්‍රදායික කලා ශිල්පීන්ගේ නිජබිමක් වෙයි. එහි ආඳාදොළ නම් ගම මාලිගාවගේ සාර්ලිස් සිත්තරා ජන්මලාභය ලැබූ ස්ථානයයි. ඒ, වර්ෂ 1880 ජුනි 25 වැනි ද ය. ඔහු එහි කලා පරපුරක ප්‍රතිභාපූර්ණ අංකුරයක් විය.

ඔහු සුප්‍රසිද්ධ පඬිරුවනක් වූ වැලිතර යු. ඒ. ඤාණතිලක නාහිමි වෙතින් මූලික සිප්සතර හැදෑරී ය. සිංහල, පාලි, සංස්කෘත ආදි භාෂා මෙන් ම චිත්‍ර මූර්ති ශිල්පය හා කාව්‍ය රචනයෙහි ද ඔහු එක සේ දස්කම් පෑවේ ය. පසුව ජීවිතයේ නවෝදය පතා ඔහු මාලිගාකන්දේ විද්‍යෝදය පිරිවෙනට පැමිණියේ ය. එකල එහි වැඩ සිටියෝ හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමිපාණෝ ය. එහිමියෝ මොහුගේ සහජ වාසනා මහිමය දැක එහි අන්තේවාසිකයෙකු ලෙස ඔහු නතර කර ගත්හ. උන් වහන්සේ ආරම්භ කළ විහාර මන්දිරයන්හි සිතුවම්කරණයෙහි නියැළුණු ශිල්පීන් සමඟ ඔහු සම්බන්ධ විය. එය සාර්ලිස්

සිත්තාරාගේ ජීවිතයේ මඟ සලකුණක් විය.

එදා විහාර චිත්‍ර කර්මාන්තයෙහි යෙදුණෝ රිචඩ් හෙන්රිකස් ප්‍රධාන ශිල්පීහු ය. ඔවුන්ගේ ආභාසය නිසා සාර්ලිස්ගේ චිත්‍ර නව සම්ප්‍රදායක මුහුණුවරක් ගත්තේ ය. සිය දැනුම මෙන් ම කලා කුසලතාව ද දියුණු කරගත් ඔහු භාරතීය හා බටහිර කලා සම්ප්‍රදායන්ගේ සංකලනයෙන් යුත් නව ආරක ශෛලියක් අනුගමනය කළේ ය. ඔහුගේ මෙම නව චිත්‍ර සම්ප්‍රදය අතිශය ජනප්‍රිය විය. මාලිගාකන්දේ දී සිතුවම් කළ බෞද්ධ චිත්‍රවල උසස් බව නිසා ඔහුට විහාර චිත්‍ර කර්මාන්ත සඳහා ආරාධනා ගලා ආවේ ය.

මූර්ති ශිල්පයෙහි ද ඔහු දස්කම් පෑ කෙනෙකි. කොළඹ අශෝකාරාමය, ඉසිපතනාරාමය, වේළුවනාරාමය, පොදුපිටියේ පූජාරාමය, ඊරියවැටිය සුදර්ශනාරාමය, තිස්මහාරාමය, ඉඳුරුවේ යාල්ගම විහාරය ඔහු විසින් නිම කරන ලද සිතුවම් අයත් විහාරස්ථාන කිහිපයකි. මේ සියල්ලට ම වඩා සාර්ලිස් නාමය බොදු ජන හදවත්හි අනුස්මරණය වන්නේ බුදු සිරිත විදහා පාමින් දිය සායමෙන් කළ සිතුවම් රාශිය නිසා ය. පිටකොටුවේ ව්‍යාපාරික ඩී.ඩී පේද්‍රිස් මහතාගේ ආරාධනය පරිදි නිම කළ මේ චිත්‍ර ජර්මනියට යවා මුද්‍රණය කරවා බෙදා හැරිණ.

මේ අතුරින් සීවලී මහ රහතන් වහන්සේගේ චිත්‍රයට අද පවා ජනයා පූජෝපහාර දක්වති.

විහාර චිත්‍ර කර්මාන්තයට අමතර ව බෞද්ධ සඟරා, පොත්පත් ආදියට ද ඔහු චිත්‍ර සැපයුවේ ය. බුදු සිරිත මූර්තිමත් කරන වෙසක් තොරණ, වෙසක්පත් ආදිය සඳහා ද පුරෝගාමී මෙහෙවරක යෙදිණි. එතැනින් නොනැවතී කොළඹ පිටකොටුවේ බෞද්ධ මන්දිරය හා දෙමටගොඩ ලංකා චිත්‍ර කර්ම විද්‍යාලය ඇරඹී ය. ඔහු පුත් සුසිල් ප්‍රේමරත්න ද පියා මෙන් කලා කටයුතුවල නියැළුණේ ය.

2500 බුද්ධ ජයන්තිය නිමිත්තෙන් මාතර වෙහෙරහේනේ 88 රියන් බුද්ධ ප්‍රතිමා වහන්සේ මූර්තිමත් කිරීමේ කටයුතු ද ඔහු ඇරඹී ය. එම කර්මාන්තය නිම කිරීමට පෙර වර්ෂ 1955 නොවැම්බර් 21 දින සාර්ලිස් ගුරුතුමා මෙලොවින් සමුගත්තේ ය.